# එංගලන්ත ක්‍රිකට් පිටියට ශ්‍රී ලංකා තරු පායයි




ලෝක ක්‍රිකට් ක්‍රීඩා ඉතිහාසය තුළ එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලියට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. වසර 135ක අතීතයක් හිමි එය ලොව පැරණිතම පළමු පෙළ ක්‍රිකට් තරඟ මාලාව ලෙසට ද ඉතිහාසයට එක්ව තිබේ.

1873 වසරේදී ඇරඹුණු මෙම තරඟාවලිය සඳහා මේ වන විට ප්‍රාන්ත 18කින් කණ්ඩායම් ඉදිරිපත් කරනු ලැබේ. අප්‍රේල් මැද භාගයේ සිට සැප්තැම්බර් අගභාගය දක්වා පැවැත්වෙන එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලියට සිව්දින තරඟ පෙළක් මෙන්ම, එක්දින තරඟ මාලා 3ක් ඇතුළත්ය.

එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලියේ දී ඒ ඒ ප්‍රාන්තවලට විදෙස් ක්‍රීඩකයන්ගෙ ද දායකත්වය ලබාගැනීමට හැකිවීම නිසා, විශේෂ මුහුණුවරක් එක්ව තිබේ. කලින්කලට මෙසේ එක්කර ගත හැකි විදෙස් ක්‍රීඩකයන්ගේ සංඛ්‍යාව වෙනස් වූ අතර මේ වන විට ප්‍රාන්ත කණ්ඩායමකට එක්කර ගත හැක්කේ එක් විදෙස් ක්‍රීඩකයෙකු පමණි.

තරඟාවලියේ මුල් යුගය විමසා බැලීමේදී පැහැදිළි වන්නේ හැම ප්‍රාන්තයක්ම වැඩි දායකත්වයක් ලබාගෙන ඇත්තේ ඕස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව හා බටහිර ඉන්දීය කොදෙව් යන රටවල විදෙස් ක්‍රීඩකයන් බවයි. පසුකාලීනව එම තත්වය තරමක් වෙනස් වී ඉන්දීය, පකිස්තානු වැනි රටවල ක්‍රීඩකයන්ට ද ඒ සඳහා අවස්ථාව ලැබී තිබේ. එහෙත් එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලිය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයන්ට වරම් ලැබී ඇත්තේ අතලොස්සකි.

එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලිය නියෝජනය කළ ප්‍රථම ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩකයා ලෙස ඉතිහාසයට එක්ව සිටින්නේ දොස්තර සී.එච් ගුණසේකරය. 1919 වසරේදී මිඩ්ල්සෙක්ස් ප්‍රාන්ත පිල නියෝජනය කරමින් ඔහු එම ඓතිහාසික අවස්ථාව හිමිකර ගත්තේය. 1920, 21 වසරවලද දොස්තර ගුණසේකර මිඩ්ල්සෙක්ස් පිල නියෝජනය කළේය. එම වසර තුන තුල තුළදී, ඉනිම 55කට දායක වූ ඔහු එහිදී ලකුණු 644ක් ලබා ඇති අතර කඩුළු 75ක් ද දවාගෙන ඇත. හයේ පහර 3ක් හා 4 පහර 11ක් ගසමින් සරේ පිලට එරෙහිව රැස්කළ ලකුණු 80 එම තරඟ ඉතිහාසයේ ඔහුගෙ හොඳම ඉනිම ලෙස සටහන්ව තිබේ.

එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලිය සඳහා ක්‍රීඩා කළ ඊළඟ ශ්‍රී ලංකා ක්‍රීඩකයා වන්නේ ලැඩී අවුට්ස්කෞන්ය. 1946 සිට 1959 දක්වා වුස්ටර්ෂයර් ප්‍රාන්ත පිළ නියෝජනය කළ ලැඩී එම කාලය තුළ රැස්කළ ලකුණු සංඛ්‍යාව 15,484කි. එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලියක දී ශතකයක් රැස්කළ පළමු ශ්‍රී ලාංකික ක්‍රීඩකයා ලෙසට ද ඉතිහාසයට එක්ව ඇති ඔහු 1948 දී ඩාර්බිෂයර් පිලට එරෙහිව ලකුණු 126ක් රැස්කර එම දස්කම කළේය. ශතක 25ක් රැස්කරමින්, ඉහළම ලකුණු සංඛ්‍යාව ලෙස ලකුණු 215ක් රැස්කරමින් එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් පිටියේ ඔහු පෑ හපන්කම් අදට ද වාර්තා පොත් අතර කැපී පෙනේ.

බම්බලපිටිය ශාන්ත පීතර පාසලෙන් බිහිවූ අසිරිමත් පිතිකරුවකු ලෙස ඉතිහාසයට එක්ව ඇති ක්ලයිව් ඉන්මන්, එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලිය නියෝජනය කරමින් සුපිරි දස්කම් පෑ තවත් ක්‍රිකට් ක්‍රීඩකයෙකි. 1962 වසරේ සිට 1975 වසර දක්වා ලෙස්ටශයර් ප්‍රාන්ත පිල නියෝජනය කළ ඉන්මන් එහිදී රැස්කළ ලකුණු සංඛ්‍යාව 12,500කට වැඩිය. ශතක 20ක් එම ලකුණු සංඛ්‍යාවට ඇතුළත්වීම හරහා ඔහුගේ දක්ෂතාවය මොනවට පැහැදිළි වේ. එපමණක් නොව එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් පිටියේ වේගවත්ම අර්ධ ශතකය රැස්කිරීමේ වාර්තාව තවමත් සතුව ඇත්තේ ඉක්මන්ගෙ නම ඉදිරියේය. 1965 දී නොටිංහැම්ෂයර් ප්‍රාන්ත පිලට එරෙහිව පැවති තරඟයකදී මිනිත්තු 8ක කාලයක් තුළ ඔහු මෙම දස්කම කර තිබේ.

ස්ටැන්ලි ජයසිංහ ද 1962 - 65 අතර කාලයේ ලෙස්ටර්ෂයර් ප්‍රාන්ත පිල නියෝජනය කරමින් එංගලන්ත ප්‍රාන්ත තරඟාවලියට ක්‍රීඩා කළේය. 1962 දී ලකුණු 1499ක්, 1963 දී ලකුණු 1133ක්, 1964 දී ලකුණු 1010ක් සහ 1965 ලකුණු 1332ක් රැස්කරමින් නම රැන්දූ සැටැන්ලි ජයසිංහ පිටිය වර්ණවත් කරමින් පන්දුවෙන් ද දස්කම් දක්වා තිබේ.

1973 සිට 1985 දක්වා සසෙක්ස් පිලද 1986 සිට 1994 දක්වා ලැන්කෂයර් පිලද නියෝජනය කරමින් වසර 22කට අධික කාලයක් එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලියට ක්‍රීඩාකළ ශ්‍රී ලාංකික ක්‍රීඩකයෙක් වේ. හේ නමින් ගිහාන් මෙන්ඩිස්ය. තරඟ 366කට සහභාග වී ඉනිම 643කදී ඔහු විසින් රැස්කොට ඇති ලකුණු සංඛ්‍යාව 21,436කි. එයට ශතක 41ක් හා අර්ධ ශතක 108ක් ඇතුළත්ය. ඔහුගේ ඉහළම ලකුණු සංඛ්‍යාව 209ක් ලෙස සටහන්ව ඇති අතර, රැකගෙන ඇති උඩපන්දු සංඛ්‍යාව 145කි. එක්දින තරඟ 311කටද සහභාගි වී ඇති ගිහාන්, එහිදී ශතක 8ක් හා අර්ධ ශතක 41ක් සමඟින් ලකුණු 8308ක් රැස්කර ඇත.



ගල්කිස්ස ශාන්ත තෝමස් විදුහලෙන් බිහිවූ ක්‍රීඩකයෙකු වන ගිහාන් මෙන්ඩිස් සී.සී.සී සෙබස්තිනයිට්ස් ආදී ශ්‍රී ලංකා ක්‍රීඩා සමාජ කිහිපයකට ද ක්‍රීඩා කළද ටෙස්ට් වරම් දිනා ගැනීමට නොහැකි විය.

මෙම පිරිසට අමතරව ගාමිණී ගුණසේන, ඩැන් පී රිචඩ් යන ක්‍රීඩකයෝ ද ශ්‍රී ලංකාවට ටෙස්ට් වරම් ලැබීමට පෙර එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලියට ක්‍රීඩා කළහ.

ටෙස්ට් තත්වය ලැබීමෙන් පසු ශ්‍රී ලංකාව නියෝජනය කරද්දී එංගලන්ත ප්‍රාන්ත තරඟාවලියට සහභාගි වීමට වරම්ලද ප්‍රථම ක්‍රීඩකයා ලෙස ඉතිහාසයට එක්ව ඇත්තේ, අරවින්ද ද සිල්වාය.

1995 තරඟවාරයේ දී කෙන්ට් ප්‍රාන්තය නියෝජනය කළ අරවින්ද එහිදී දිගට හරහට පිත්තෙන් බැට දෙමින්, එංගලන්ත ප්‍රාන්ත තරඟ පිටිය වර්ණවත් කළේය. වසර ගණනාවක් ප්‍රාන්ත පිටියේ පසුපසට ඇදවැටී තිබූ කෙන්ට් පිල එවර අනුශූරතාවයක් දිනාගැනීමට තරම් ඉදිරියට ආවේ අරවින්දගේ දස්කම් නිසා බව ක්‍රීඩා විචාරකයෝ අදට ද සිහිපත් කරති.

අනතුරුව තවත් ශ්‍රී ලාංකික ක්‍රීඩකයන් දෙදෙනෙකුට එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟ සඳහා සහභාගි වීමට වරම් හිමිවිය. එහිදී මුරලිදරන් ලැන්කෂයර් ප්‍රාන්ත කණ්ඩායම වෙනුවෙන් තෝරාගනු ලැබූ අතර චමින්ද වාස් හැම්පෂයර් කණ්ඩායම වෙනුවෙන් තෝරාගනු ලැබීය.

2005 වසරේ දී ශ්‍රී ලාංකික ක්‍රීඩකයන් සිව් දෙනෙකුට එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලිය සඳහා සහභාගි වීමට වරම් ලැබී ඇත. ඉතිහාසයේ පළමු වතාවට ශ්‍රී ලාංකික ක්‍රීඩකයින් මෙතරම් සංඛ්‍යාවක් එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලිය සඳහා සහභාගී වන්නේ මෙවරය. මෙවරද මුරලිදරන් ලැන්කෂයර් ප්‍රාන්ත කණ්ඩායම වෙනුවෙන් ක්‍රීඩා කරන අතර චමින්ද වාස් වුස්ටෂයර් ප්‍රාන්ත කණ්ඩායම වෙනුවෙන් ක්‍රීඩා කරයි.

මේ දෙදෙනාට අමතරව පළමු වතාවට එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලිය සඳහා සහභාගි වීමේ අවස්ථාව මෙවර උදා වී ඇත්තේ උපුල් චන්දනට හා සනත් ජයසූරියටය. උපුල් චන්දන දක්ෂ තරුණ තුන් ඉරියව් ක්‍රීඩකයෙකි. ඔහු ග්ලොස්ටෂයර් කණ්ඩායමේ විදෙස් ක්‍රීඩකයා ලෙස තෝරාගෙන ඇති අතර එය ඔහුගේ ක්‍රිකට් ජීවිතයේ අමරණීය සිහිවටනයක් වනවාට සැකයක් නැත.





ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩාවේ ඉහළින්ම වැජඹෙන තරු අතර සනත් ජයසූරියට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. 1996 දී ලෝක ක්‍රිකට් කිරුළ ශ්‍රී ලංකාවට දිනා දීමට මුල් වී ලෝකයේ වටිනාම ක්‍රීඩකයා ලෙස කිරුළු පැළඳි ඔහු ලංකාවේ මෙතෙක් බිහිවූ සාර්ථකම ක්‍රිකට් නායකයාද වෙයි. එවන් දස්කම්වලින් පිරුණු අයෙකු වුවද කුමක්දෝ අවාසනාවකට ඔහුට මීට පෙර කිසිදු අවස්ථාවක එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලිය සඳහා සහභාගි වීමට අවස්ථාව ලැබුණේ නැත. කෙසේ හෝ ලැබිය යුතු දේ කවදා හෝ සුදුස්සාට ලැබෙන බවට පවතින අදහස සම්පූර්ණ කරමින් තම ක්‍රිකට් ජීවිතයේ අවසාන භාගය ගෙවමින් සිටින ජයසූරියට මෙවර සරේ ප්‍රාන්තයේ විදෙස් ක්‍රීඩකයා ලෙස ක්‍රීඩා කිරීමේ අවස්ථාව උදා වී ඇත.

මේ අනුව බලන කල මෙවර එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් තරඟාවලිය යනු ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයින්ට තම දස්කම් විදහා පෑමට ඉඩසලසා ඇති තරඟාවලියකි. අනෙක් අතට මෙය ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයන්ට දිගින් දිගටම එංගලන්ත ප්‍රාන්ත තරඟාවලිය සඳහා සහභාගි වීමට අවස්ථාව ලබා දීමේ පෙරහුරුවක් වැනිය. මුරලි, සනත්, වාස් හා චන්දන යන ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩකයන් සිව්දෙනා මෙවර එංගලන්ත ප්‍රාන්ත තරඟාවලිය තුළ දක්වන දස්කම් හරහා ශ්‍රී ලාංකික ක්‍රිකට් වංශ කතාවේ නව පිටුවක් පෙරළෙනවා නොඅනුමානය.

නිශාන් හේමන්ත